# සංක්ෂේපයෙන්

ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ (1997) සංඛ්‍යාලේඛන වාර්තා අනුව වාර්ෂිකව සියයට අනූ අටයි දශම දෙකක් (98.2%) පමණ වන විශාල සිසු පිරිසක් විශ්ව විද්‍යාලයෙන් මෙපිට විවිධ අවස්ථාවලදී පාසැල් හැර යාම සිදු කරන බව පෙනේ. මේ සියළු දෙනා බොහෝ විට නුපුහුණු ශ්‍රමිකයින් වශයෙන් ශ්‍රම හමුදාවට එකතුවීම සාමාන්‍යයෙන් සිදුවන්නකි. මෙතෙක් විධිමත් අධ්‍යාපනයෙන් ලද විෂය දැනුමට පමණක් සීමා වී තිබුණු අධ්‍යාපනය, වැඩ ලෝකයට ප්‍රමාණවත් නොවන බවත්, අධ්‍යාපනය හා වැඩ ලෝකය අතර ඉතාමත් විශාල පරස්පර වීමක් ඇති බවත් බොහෝ දෙනාට අවබෝධ වන්නේ වැඩ ලෝකයේ රැකියා අවස්ථා ලබා ගැනීමට දරනු ලබන උත්සහායේදීය. පාසැල් අධ්‍යාපනයේදී ප්‍රායෝගික කුසලතාවයට අඩු සැලකිල්ලක් ලැබෙන පරිද්දෙන් විෂයමාලා හඳුන්වා දී තිබීම මෙම ගැටළුව මතුවීමට ප්‍රධාන හේතුව බව වැඩි දෙනාගේ මතයයි.

අධ්‍යාපනය හා වැඩ ලෝකය අතර පරතරය අඩු කිරීමට නම්, පාසැල් අධ්‍යාපනයේදී ප්‍රායෝගික පුහුණුවක් ලබා දිය යුතුය. දැනට ඇතැම් විෂයයන් තුලින් වෘත්තීය පුහුණුව පිළිබඳව කුසලතා ලබා දුන්නද වැඩ ලෝකයට එය කිසිසේත් ප්‍රමාණවත් නොවේ. මෙලෙස විධිමත් අධ්‍යාපනයෙන් නොලැබෙන වෘත්තීය පුහුණුව වෙනත් ක්‍රම මගින් ලබාදීමට විවිධ කටයුතු යොදා ඇත. එනම් විධිමත් අධ්‍යාපනයේ ඌණ පූරණයක් ලෙස අවිධිමත් සහ නොවිධිමත් අධ්‍යාපනයෙන් එය ඉටු කෙරෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ යටතේ පාසැල් හැර යන්නන්ට වැඩ ලෝකයට අවශ්‍ය වෘත්තීය පුහුණුව ලබා දීම සඳහා නොයෙකුත් වැඩ පිළිවෙලවල් අප රට තුළ ක්‍රියාත්මක වේ. එනම්, වැඩ ලෝකයේ විවිධ රැකියා වලට අවශ්‍ය පුහුණුව හා විශේෂඥ දැනුම ලබාදීමට නොයෙකුත් පාඨමාලා සංවිධානය කර ඇත. රාජ්‍ය අංශයත්, පෞද්ගලික අංශයත්, රාජ්‍ය නොවන සංවිධානත්, වෘත්තීය පුහුණුව සම්බන්ධයෙන් වැඩි සැලකිල්ලක් දක්වා ඇත.

දියගල ළමා නගරය නව යෞවනයින්ට වැඩ ලෝකය සඳහා අවශ්‍ය වෘත්තිය පුහුණුව ලබා දෙන රාජ්‍ය නොවන සංවිධානයකි. මෙහිදි සිවු අවුරුදු නේවාසික වෘත්තිය පුහුණුව හදාරනු ලබන පිරිමි සිසුන් විශාල පිරිසක් වාර්ෂිකව පුහුණු ශ්‍රමිකයින් ලෙස වැඩ ලෝකයට එක්වෙති. මෙම දියගල ළමා නගරය පිළිබඳවත්, එහි ක්‍රියාත්මක කෙරෙන වැඩ පිළිවෙල පිළිබඳවත් ලේඛනගත තොරතුරු පරීක්ෂාව, ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණය තුළින් ප්‍රත්‍යෙක අධ්‍යයනයක් සිදු කරන ලදි. ඒ සඳහා නියැදි සිසුන් සියයක් (100) යොදා ගැණුනි. ඒ අනුව කරන ලද අධ්‍යයනයේදි දියගල ළමා නගරය වෘත්තිය පුහුණුව සම්බන්ධයෙන් ක්‍රමවත් ඵලදායි, වැඩ පිළිවෙලක් දියත් කරන බවත් එයින් සමස්ත සමාජයටමත්, මුළු රටටත් විශාල සේවයක් සිදුවන බවත් පැහැදිලි වේ.